# සතිපතා ආර්ථික දර්ශක



## 2024 දෙසැම්බර් 27

සංඛ්‍යාන දෙපාර්තමේන්තුව
ශ්‍රී ලංකා මහ බැංකුව

# සතියේ සුවිශේෂී කරුණු

## මූර්ත අංශය

ජාතික පාරිභෝගික මිල දර්ශකය (ජා.පා.මි.ද.) (2021=100) මත පදනම් වූ වාර්ෂික ලක්ෂ්‍යමය මතුපිට උද්ධමනය, අඛණ්ඩව තුන්වන මාසයටත් සෘණ අගයක පවතිමින් 2024 ඔක්තෝබර් මාසයේ දී වාර්තා වූ සියයට 0.7ක අවධමනයට සාපේක්ෂව 2024 නොවැම්බර් මාසයේ දී සියයට 1.7ක අවධමනයක් වාර්තා කළේය. ආහාර කාණ්ඩයේ අයිතමවල මිල 2024 නොවැම්බර් මාසයේ දී වාර්ෂික ලක්ෂ්‍යමය පදනම මත නොවෙනස්ව පැවතුණි. මේ අතර, 2024 නොවැම්බර් මාසයේ දී ආහාර නොවන කාණ්ඩය සියයට 3.1ක අවධමනයක් වාර්තා කළේය. තවද, ජා.පා.මි.ද. මත පදනම් වූ මූලික උද්ධමනය, 2024 ඔක්තෝබර් මාසයේ පැවති සියයට 1.7හි සිට 2024 නොවැම්බර් මාසයේ දී සියයට 1.5ක් දක්වා තවදුරටත් පහළ ගියේ ය.

2024 වසරේ දෙසැම්බර් 23 සහ 27 අතර, බොරතෙල් මිල ගණන් මිශ්‍ර ක්‍රියාකාරිත්වයක් පෙන්නුම් කළ අතර, ගෝලීය වර්ධනය සහ බොරතෙල් ඉල්ලුම වර්ධනය සඳහා හේතු වනු ඇතැයි අපේක්ෂා කෙරෙන, 2025 වර්ෂයේ දී සිදු කිරීමට නියමිත එක්සත් ජනපද ප්‍රතිපත්ති ලිහිල් කිරීම සහ අතිරේක මූල්‍ය උත්තේජක සඳහා චීනයේ සැලසුම් පිළිබඳ සුබවාදී අපේක්ෂා ඊට හේතු විය. කෙසේ වෙතත්, නත්තල් නිවාඩුවට පෙර වෙළඳ කටයුතු අවම වීම සහ ඩොලරය ශක්තිමත් වීම හේතුවෙන් මිල ගණන් පහළ ගියේ ය. සතිය අවසන් වන විට බොරතෙල් මිල ගණන් බොහෝ දුරට ස්ථාවරව පැවතුණි. සමස්තයක් ලෙස, සලකා බලන කාලපරිච්ඡේදය තුළ දී, බ්‍රෙන්ට් සහ ඩබ්ලිව්.ටී.අයි බොරතෙල් බැරලයක මිල, පිළිවෙළින්, එක්සත් ජනපද ඩොලර් 0.05කින් සහ එක්සත් ජනපද ඩොලර් 0.24කින් පහළ ගියේ ය.

## මුදල් අංශය

සතිපතා බරිත සාමාන්‍ය ප්‍රමුඛ ණය අනුපාතිකය පෙර සතිය හා සැසඳීමේ දී 2024 දෙසැම්බර් මස 27 වන දිනෙන් අවසාන වන සතිය සඳහා පදනම් අංක 34කින් සියයට 9.06ක් දක්වා ඉහළ ගියේය.

බරිත සාමාන්‍ය ඒක්ෂණ මුදල් අනුපාතිකය පෙර සතියේ අග පැවති සියයට 8.00ට සාපේක්ෂව 2024 දෙසැම්බර් මස 27 වන දින සියයට 7.99ක් විය.

සංසරණයේ පවතින මුදල් ප්‍රමාණය ඉහළ යාම සහ වාණිජ බැංකු සතු තැන්පතු ප්‍රමාණය ඉහළ යාම ප්‍රධාන වශයෙන් හේතුකොටගෙන පසුගිය සතියට සාපේක්ෂව සංචිත මුදල් ඉහළ ගියේය.

සමස්ත වෙළඳපොළ ද්‍රවශීලතාව පෙර සතියේ අග පැවති රුපියල් බිලියන 178.400ක අතිරික්තයට සාපේක්ෂව මෙම සතියේ දී රුපියල් බිලියන 136.147ක අතිරික්තයක් විය.

පසුගිය සතිය හා සැසඳීමේ දී 2024 දෙසැම්බර් මස 27 දින වන විට, සමස්ත කොටස් මිල දර්ශකය සියයට 4.89කින් දර්ශක අගය 15,535.60ක් දක්වා ඉහළ ගිය අතර, එස් ඇන්ඩ් පී ශ්‍රී ලංකා 20 දර්ශකය සියයට 5.56කින් දර්ශක අගය 4,666.65ක් දක්වා ඉහළ ගියේය.

## රාජ්‍ය මූල්‍ය අංශය

2024 වසරේ ඔක්තෝබර් මාසයෙන් අවසන් වන මාස දහය තුළ දී, රාජ්‍ය ආදායම සහ ප්‍රදාන 2023 වසරේ අනුරූප කාලපරිච්ඡේදයේ දී වාර්තා වූ රු. බිලියන 2,434.0ට සාපේක්ෂව රු. බිලියන 3,266.9ක් දක්වා ඉහළ ගියේය.

2024 වසරේ ජනවාරි සිට ඔක්තෝබර් දක්වා වන කාලය තුළ දී, සමස්ත වියදම සහ ශුද්ධ ණය දීම් 2023 වසරේ අනුරූප කාලපරිච්ඡේදයේ දී වාර්තා වූ රු. බිලියන 3,981.1ට සාපේක්ෂව රු. බිලියන 4,327.7ක් දක්වා වැඩි විය.

2024 වසරේ ජනවාරි සිට ඔක්තෝබර් දක්වා වන කාලය තුළ දී, සමස්ත අයවැය හිඟය 2023 වසරේ අනුරූප කාලපරිච්ඡේදයේ දී වාර්තා වූ රු. බිලියන 1,547.0ට සාපේක්ෂව රු. බිලියන 1,060.7ක් දක්වා අඩු විය.

ශුද්ධ දේශීය මූල්‍යනය, 2023 වසරේ අනුරූප කාලපරිච්ඡේදයේ දී පැවති රු. බිලියන 1,477.8ට සාපේක්ෂව, 2024 වසරේ මුල් මාස දහය තුළ දී රු. බිලියන 786.3ක් දක්වා පහළ ගියේය. ශුද්ධ විදේශීය මූල්‍යනය, 2023 වසරේ අනුරූප කාලපරිච්ඡේදයේ දී වාර්තා වූ රු. බිලියන 69.2ට සාපේක්ෂව 2024 වසරේ මුල් මාස දහය තුළ දී, රු. බිලියන 274.5ක් දක්වා ඉහළ ගියේය.

මධ්‍යම රජයේ නොපියවූ ණය ප්‍රමාණය 2023 වසර අවසානයේ දී පැවති රු. බිලියන 28,695.9 සිට 2024 වසරේ සැප්තැම්බර් මාසය අවසාන වන විට රු. බිලියන 28,574.7ක් දක්වා පහළ ගියේය. 2024 වසරේ සැප්තැම්බර් මාසය අවසාන වන විට සමස්ත නොපියවූ දේශීය ණය ප්‍රමාණය රු. බිලියන 17,595.1ක් වූ අතර සමස්ත නොපියවූ විදේශීය ණය ප්‍රමාණය රු. බිලියන 10,979.6ක් විය.

මෙම සතියේ දී, ප්‍රාථමික සහ ද්විතීයික වෙළඳපොළවල් දෙකෙහිම භාණ්ඩාගාර බිල්පත් ඵලදා අනුපාතික පහළ යාමක් පෙන්නුම් කළ අතර ද්විතීයික වෙළඳපොළ භාණ්ඩාගාර බැඳුම්කර ඵලදා අනුපාතිකද පහළ යාමක් පෙන්නුම් කළේය.

පසුගිය සතියට සාපේක්ෂව, මෙම සතිය තුළ දී අනේවාසිකයන් සතු නොපියවූ භාණ්ඩාගාර බිල්පත් සහ භාණ්ඩාගාර බැඳුම්කර ප්‍රමාණයෙහි රුපියල් අගය සියයට 4කින් ඉහළ යාමක් දක්නට ලැබුණි.

මෙම සතිය තුළ දී පවත්වන ලද භාණ්ඩාගාර බිල්පත් වෙන්දේසිය සඳහා ලැබුණු මුළු ලංසු ප්‍රමාණය ඉදිරිපත් කළ මුළු ප්‍රමාණය මෙන් 2.1 ගුණයක් විය.

පසුගිය සතියට සාපේක්ෂව මෙම සතිය තුළ දී භාණ්ඩාගාර බිල්පත් හා භාණ්ඩාගාර බැඳුම්කර මුළු ද්විතීයික වෙළඳපොළ ගනුදෙනු ප්‍රමාණය දළ වශයෙන් සියයට 23.8ක පහළ යාමක් දක්නට ලැබේ.

## විදේශීය අංශය


2024 වසරේ දෙසැම්බර් 27 වන දින දක්වා කාලය තුළ දී ශ්‍රී ලංකා රුපියල, එක්සත් ජනපද ඩොලරයට සාපේක්ෂව සියයට 10.1කින් අතිප්‍රමාණය විය.

# මූර්ත අංශය

## 1.1 මිල දර්ශක


| ජාතික පාරිභෝගික මිල දර්ශකය (ජා.පා.මි.ද.) (2021=100) | 2023 නොවැම්බර් | 2024 ඔක්තෝබර් | 2024 නොවැම්බර් |
|---|---|---|---|
| මතුපිට උද්ධමනය - ( ජා. පා. මි. ද. ) | 206.0 | 202.1 | 202.4 |
| මාසික ප්‍රතිශත වෙනස % | 1.2 | (0.5) | 0.1 |
| වාර්ෂික සාමාන්‍ය ප්‍රතිශත වෙනස % | - | 2.5 | 2.2 |
| ලක්ෂ්‍යමය ප්‍රතිශත වෙනස % | 2.8 | (0.7) | (1.7) |
| මූලික උද්ධමනය - ( ජා. පා. මි. ද. ) | 189.3 | 192.4 | 192.2 |
| වාර්ෂික සාමාන්‍ය ප්‍රතිශත වෙනස % | - | 2.4 | 2.5 |
| ලක්ෂ්‍යමය ප්‍රතිශත වෙනස % | 0.8 | 1.7 | 1.5 |

ජා.පා.මි.ද. ලක්ෂ්‍යමය ප්‍රතිශත වෙනස




| කොළඹ පාරිභෝගික මිල දර්ශකය (කො.පා.මි.ද.) (2021=100) | 2023 නොවැම්බර් | 2024 ඔක්තෝබර් | 2024 නොවැම්බර් |
|---|---|---|---|
| මතුපිට උද්ධමනය - ( කො. පා. මි. ද. ) | 193.4 | 189.9 | 189.4 |
| මාසික ප්‍රතිශත වෙනස % | 1.0 | (0.5) | (0.3) |
| වාර්ෂික සාමාන්‍ය ප්‍රතිශත වෙනස % | - | 2.2 | 1.7 |
| ලක්ෂ්‍යමය ප්‍රතිශත වෙනස % | 3.4 | (0.8) | (2.1) |
| මූලික උද්ධමනය - ( කො. පා. මි. ද. ) | 172.4 | 177.5 | 177.1 |
| වාර්ෂික සාමාන්‍ය ප්‍රතිශත වෙනස % | - | 2.9 | 3.1 |
| ලක්ෂ්‍යමය ප්‍රතිශත වෙනස % | 0.8 | 3.0 | 2.7 |

කො.පා.මි.ද. ලක්ෂ්‍යමය ප්‍රතිශත වෙනස




මූලය: ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව

## 1.2 මිල

### 1.2.1 පිටකොටුව වෙළඳපොළ

| අයිතමය (කිලෝ ග්‍රෑමයට රුපියල්) | තොග මිල ගණන්හි සාමාන්‍යය | | | | සිල්ලර මිල ගණන්හි සාමාන්‍යය | | | |
|---|---|---|---|---|---|---|---|---|
| | පසුගිය වසර | පසුගිය මාසය | පසුගිය සතිය | මෙම සතිය | පසුගිය වසර | පසුගිය මාසය | පසුගිය සතිය | මෙම සතිය |
| සම්බා | 235.00 | 230.00 | 243.00 | 235.00 | 250.00 | 240.00 | 260.00 | ලැනො. |
| රතු කැකුළු | 180.00 | 218.00 | 228.00 | 215.00 | 200.00 | 235.00 | 250.00 | ලැනො. |
| බෝංචි | 400.00 | 512.50 | 350.00 | 437.50 | 450.00 | 562.50 | 400.00 | 487.50 |
| ගෝවා | 450.00 | 80.00 | 190.00 | 150.00 | 500.00 | 127.50 | 240.00 | 200.00 |
| කැරට් | 575.00 | 132.50 | 142.00 | 145.00 | 625.00 | 182.50 | 192.00 | 195.00 |
| තක්කාලි | 375.00 | 245.00 | 450.00 | 307.50 | 425.00 | 295.00 | 502.00 | 357.50 |
| වට්ටක්කා | 160.00 | 120.00 | 158.00 | 200.00 | 200.00 | 160.00 | 208.00 | 250.00 |
| පතෝල | 200.00 | 232.50 | 316.00 | 257.50 | 250.00 | 282.50 | 366.00 | 307.50 |
| වම්බටු | 700.00 | 262.50 | 284.00 | 380.00 | 750.00 | 312.50 | 334.00 | 430.00 |
| අමු මිරිස් | 1,250.00 | 512.50 | 960.00 | 950.00 | 1,350.00 | 600.00 | 1,060.00 | 1,050.00 |
| දෙහි | 300.00 | 512.50 | 295.00 | 187.50 | 400.00 | 612.50 | 400.00 | 275.00 |
| රතු ළූණු ( දේශීය) | 500.00 | 279.50 | 280.00 | ලැනො. | 550.00 | 400.00 | ලැනො. | ලැනො. |
| ලොකු ළූණු ( ආනයනික) | 415.00 | 270.75 | 189.20 | 162.00 | 475.00 | 325.00 | 250.80 | 222.50 |
| අර්තාපල් ( දේශීය) | 351.50 | 332.00 | 345.20 | 350.00 | 400.00 | 400.00 | 400.00 | 400.00 |
| වියළි මිරිස් ( ආනයනික) | 1,050.00 | 703.00 | 731.40 | 750.00 | 1,100.00 | 830.00 | 800.00 | 900.00 |
| රතු පරිප්පු | 300.00 | 275.00 | 272.40 | 272.50 | 315.00 | 300.00 | 290.00 | 290.00 |
| බිත්තර-සුදු ( ඒකක මිල) | 50.00 | 39.00 | 29.20 | 26.00 | 50.50 | 39.50 | 29.70 | 26.50 |
| පොල් ( ගෙඩියක මිල) | 90.00 | 135.00 | 145.00 | 147.50 | 125.00 | 170.00 | 180.00 | 180.00 |

### 1.2.2 මරදගහමුල සහල් මධ්‍යස්ථානය

| අයිතමය (කිලෝ ග්‍රෑමයට රුපියල්) | සහල් තොග මිල ගණන්හි සාමාන්‍යය | | | |
|---|---|---|---|---|
| | පසුගිය වසර | පසුගිය මාසය | පසුගිය සතිය | මෙම සතිය |
| සම්බා | 228.00 | 234.50 | 235.00 | 236.25 |
| සුදු කැකුළු | 195.00 | 223.75 | 215.00 | 216.25 |
| රතු කැකුළු | 186.00 | 228.00 | ලැනො. | ලැනො. |
| නාඩු | 201.50 | 232.50 | 225.00 | 226.25 |

ලැනො. - ලැබී නොමැත.


## 1.2.3 දඹුල්ල ආර්ථික මධ්‍යස්ථානය


| අයිතමය (කිලෝ ග්‍රෑමයට රුපියල්) | තොග මිල ගණන්හි සාමාන්‍යය | |
|---|---|---|
| | පසුගිය සතිය | මෙම සතිය |
| සම්බා | 233.00 | 236.25 |
| රතු කැකුළු | ලැනො. | ලැනො. |
| බෝංචි | 250.00 | 412.50 |
| ගෝවා | 157.00 | 123.75 |
| කැරට් | 124.00 | 161.25 |
| තක්කාලි | 414.00 | 278.75 |
| වට්ටක්කා | 151.00 | 168.75 |
| පතෝල | 287.00 | 197.50 |
| වම්බටු | 344.00 | 351.25 |
| අළු කෙසෙල් | 124.00 | 111.25 |
| රතු ළූණු ( දේශීය) | 296.00 | 290.00 |
| රතු ළූණු ( ආනයනික) | 365.00 | 375.00 |
| ලොකු ළූණු ( ආනයනික) | 175.00 | 143.75 |
| අර්තාපල් (දේශීය) | 297.50 | 291.25 |
| අර්තාපල් ( ආනයනික) | 210.60 | 202.50 |
| වියළි මිරිස් ( ආනයනික) | 675.00 | 686.67 |
| පොල් ( ගෙඩියක මිල) | 123.00 | 119.50 |


## 1.2.4 නාරාහේන්පිට ආර්ථික මධ්‍යස්ථානය


| අයිතමය (කිලෝ ග්‍රෑමයට රුපියල්) | සිල්ලර මිල ගණන්හි සාමාන්‍යය | |
|---|---|---|
| | පසුගිය සතිය | මෙම සතිය |
| සුදු නාඩු | 230.00 | 230.00 |
| රතු කැකුළු | ලැනො. | 220.00 |
| බෝංචි | 620.00 | 765.00 |
| ගෝවා | 352.00 | 350.00 |
| කැරට් | 280.00 | 305.00 |
| තක්කාලි | 588.00 | 505.00 |
| වට්ටක්කා | 208.00 | 215.00 |
| පතෝල | 476.00 | 460.00 |
| වම්බටු | 468.00 | 610.00 |
| අමු මිරිස් | 1,160.00 | 1,133.33 |
| රතු ළූණු ( දේශීය) | ලැනො. | ලැනො. |
| ලොකු ළූණු ( ආනයනික) | 316.00 | 300.00 |
| අර්තාපල් ( දේශීය) | 448.00 | 480.00 |
| අර්තාපල් ( ආනයනික) | 260.00 | 260.00 |
| වියළි මිරිස් ( ආනයනික) | 850.00 | 850.00 |
| රතු පරිප්පු | 300.00 | 300.00 |
| සුදු සීනි | 250.00 | 250.00 |
| බිත්තර- සුදු ( ඒකක මිල) | 31.00 | 27.75 |
| පොල් ( ගෙඩියක මිල) | 150.00 | 150.00 |


නාරාහේන්පිට ආර්ථික මධ්‍යස්ථානය - සිල්ලර මිල




## 1.2.5 මාළු වෙළඳපොළ


| | පෑලියගොඩ | | මීගමුව | | | | නාරාහේන්පිට | |
|---|---|---|---|---|---|---|---|---|
| | තොග මිල ගණන්හි සාමාන්‍යය | | තොග මිල ගණන්හි සාමාන්‍යය | | සිල්ලර මිල ගණන්හි සාමාන්‍යය | | සිල්ලර මිල ගණන්හි සාමාන්‍යය | |
| | පසුගිය සතිය | මෙම සතිය | පසුගිය සතිය | මෙම සතිය | පසුගිය සතිය | මෙම සතිය | පසුගිය සතිය | මෙම සතිය |
| කෙලවල්ලා | 1,390.00 | 1,225.00 | 900.00 | 1,050.00 | 1,390.00 | 1,503.33 | 2,416.00 | 2,240.00 |
| බලයා | 760.00 | 687.50 | 653.33 | 800.00 | 833.33 | 980.00 | 1,088.00 | 1,006.67 |
| සාලයා | 415.00 | 350.00 | 370.00 | 300.00 | 506.00 | 450.00 | 508.00 | 505.00 |
| හුරුල්ලා | 916.67 | 900.00 | 790.00 | 800.00 | 973.33 | 990.00 | 1,080.00 | 1,180.00 |

ලැනො. - ලැබී නොමැත.

## 1.3 කර්මාන්ත මූලය අනුව දළ දේශීය නිෂ්පාදිතය (2015 ස්ථාවර මිල අනුව) - එකතු කළ අගය මත වර්ධන අනුපාතිකය

| අයිතමය | වාර්ෂික | | තෙවන කාර්තුව | |
|---|---|---|---|---|
| | 2022 (ඇ)(ආ) | 2023 (ආ) | 2023(ඇ)(ආ) | 2024 (ආ) |
| කෘෂිකාර්මික | (4.2) | 2.6 | 4.2 | 3.0 |
| කාර්මික | (16.0) | (9.2) | (0.7) | 10.8 |
| සේවා | (2.6) | (0.2) | 1.7 | 2.6 |
| භාණ්ඩ හා සේවා මත අය කෙරෙන බදු -සහනාධාර | (12.4) | 2.8 | 8.5 | 13.3 |
| දළ දේශීය නිෂ්පාදිතය | (7.3) | (2.3) | 1.6 | 5.5 |

(ඇ) සංශෝධිත
(ආ) තාවකාලික





මූලය: ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව

## 1.4 කෘෂිකාර්මික නිෂ්පාදනය

| අයිතමය | ඔක්තෝබර් | | % වෙනස |
|---|---|---|---|
| | 2023 (අ) | 2024 (අ) | |
| තේ (කි.ග්‍රෑ. මිලියන) | 22.9 | 21.1 | (7.5) |
| රබර් (කි.ග්‍රෑ. මිලියන) | 3.7 | 5.2 | 38.0 |
| පොල් (ගෙඩි මිලියන) | 268.1 | 203.8 | (24.0) |

(අ) තාවකාලික





මූලයන්: ශ්‍රී ලංකා තේ මණ්ඩලය
රබර් සංවර්ධන මණ්ඩලය
පොල් සංවර්ධන අධිකාරිය

## 1.5 කාර්මික නිෂ්පාදන දර්ශකය (කා.නි.ද) (2015=100) (අ)

| අයිතමය | ඔක්තෝබර් | | % වෙනස |
|---|---|---|---|
| | 2023 (ආ) | 2024 (ඇ) | |
| කාර්මික නිෂ්පාදන දර්ශකය | 89.3 | 95.5 | 7.0 |
| ආහාර නිෂ්පාදන | 93.9 | 95.8 | 2.0 |
| ඇඟලුම් නිෂ්පාදන | 85.3 | 92.0 | 7.8 |
| අනෙකුත් ලෝහ නොවන ඛනිජ නිෂ්පාදන | 103.3 | 102.8 | (0.5) |
| පිරිපහදුකළ ඛනිජතෙල් නිෂ්පාදන | 75.5 | 104.6 | 38.6 |
| රබර් සහ ප්ලාස්ටික් නිෂ්පාදන | 84.4 | 98.8 | 17.0 |
| රසායනික ද්‍රව්‍ය සහ රසායනික ද්‍රව්‍ය ආශ්‍රිත නිෂ්පාදන | 74.4 | 75.5 | 1.4 |
| පාන වර්ග | 98.4 | 125.5 | 27.6 |

(අ) ප්‍රධාන උප අංශ 7
(ආ) සංශෝධිත
(ඇ) තාවකාලික




මූලය: ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව


## 1.6 ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය (අ)


| ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය - නිෂ්පාදන | 2023 | | 2024 | |
|---|---|---|---|---|
| | ඔක්. | නොවැ. | ඔක්. | නොවැ. |
| දර්ශකය | 49.5 | 57.0 | 58.1 | 53.3 |


| ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය - සේවා | 2023 | | 2024 | |
|---|---|---|---|---|
| | ඔක්. | නොවැ. | ඔක්. | නොවැ. |
| ව්‍යාපාර ක්‍රියාකාරකම් දර්ශකය | 63.0 | 63.6 | 60.3 | 60.5 |

| ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය - ඉදිකිරීම් | 2023 | | 2024 | |
|---|---|---|---|---|
| | සැප්. | ඔක්. | සැප්. | ඔක්. |
| සමස්ත ක්‍රියාකාරකම් දර්ශකය | 44.3 | 50.0 | 48.6 | 54.3 |

(අ) පිළිගත් ජාත්‍යන්තර ක්‍රමවේදයන් අනුගමනය කරමින්, සේවා සහ ඉදිකිරීම් ක්‍රියාකාරකම් සඳහා ගැනුම් කළමනාකරුවන්ගේ මූලික දර්ශක ලෙස පිළිවෙළින්, සේවා අංශයේ ව්‍යාපාර ක්‍රියාකාරකම් දර්ශකය සහ ඉදිකිරීම් අංශයේ සමස්ත ක්‍රියාකාරකම් දර්ශකය සැලකෙන අතර, නිෂ්පාදන අංශයෙහි ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය, උප-දර්ශක පහක භරිත සාමාන්‍යයක් ලෙස ගණනය කරනු ලැබේ. තවද, සේවා අංශයේ ව්‍යාපාර ක්‍රියාකාරකම් දර්ශකය සහ ඉදිකිරීම් අංශයේ සමස්ත ක්‍රියාකාරකම් දර්ශකය, නිෂ්පාදන අංශයේ නිෂ්පාදන දර්ශකය හා සැසඳිය හැකිය.







## 1.7 සේවා නියුක්තිය [අ]

| අයිතමය | 2023 | 2023 කාර්තු:2 | 2024 කාර්තු:2 |
|---|---|---|---|
| ශ්‍රම බලකා සහභාගීත්ව අනුපාතිකය | 48.6 | 48.6 | 47.8 |
| සේවා වියුක්ති අනුපාතිකය | 4.7 | 5.2 | 4.7 |

**අංශය අනුව සේවා නියුක්ත පුද්ගලයන්[ආ] (මුළු සේවා නියුක්තියෙන් ප්‍රතිශතයක් ලෙස)**


| | 2023 | 2023 කාර්තු:2 | 2024 කාර්තු:2 |
|---|---|---|---|
| කෘෂිකර්මාන්ත | 26.1 | 25.7 | 25.0 |
| කර්මාන්ත | 25.5 | 26.3 | 26.5 |
| සේවා | 48.4 | 48.1 | 48.5 |




මූලය: ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව

## 1.8 වැටුප් ප්‍රමාණ දර්ශක


| අයිතමය | 2023 සැප්තැම්බර් | 2024 සැප්තැම්බර් | වෙනස % |
|---|---|---|---|
| රාජ්‍ය අංශයේ සේවකයන්ගේ වැටුප් ප්‍රමාණ දර්ශකය (2016 = 100) - නාමික | 133.1 | 161.3 | 21.2 |
| අවිධිමත් පෞද්ගලික අංශයේ සේවකයන්ගේ වැටුප් ප්‍රමාණ දර්ශකය (2018 = 100) - නාමික | 172.0 | 181.9 | 5.7 |
| කෘෂිකර්මාන්ත | 171.3 | 183.4 | 7.0 |
| කර්මාන්ත | 172.0 | 180.1 | 4.7 |
| සේවා | 172.9 | 184.3 | 6.6 |





## 1.9 බොරතෙල් සාමාන්‍ය මිල

| මාසය | 2023 ඉදිරි වෙළඳපොළ මිල (බැරලයක් එ.ජ. ඩොලර්) බ්‍රෙන්ට් (පාදක මිල) | 2023 ඉදිරි වෙළඳපොළ මිල (බැරලයක් එ.ජ. ඩොලර්) ඩබ්ලිව්.ටී.අයි. (පාදක මිල) | 2023 ලං.ඛ.නී.සං. ආනයන මිල (මි.ර.ගැ) (බැරලයක් එ.ජ. ඩොලර්) (ඇ) (ඈ) | 2024 ඉදිරි වෙළඳපොළ මිල (බැරලයක් එ.ජ. ඩොලර්) බ්‍රෙන්ට් (පාදක මිල) | 2024 ඉදිරි වෙළඳපොළ මිල (බැරලයක් එ.ජ. ඩොලර්) ඩබ්ලිව්.ටී.අයි. (පාදක මිල) | 2024 ලං.ඛ.නී.සං. ආනයන මිල (මි.ර.ගැ) (බැරලයක් එ.ජ. ඩොලර්) |
|---|---|---|---|---|---|---|
| ජනවාර | 84.28 | 78.60 | 97.93 | 78.93 | 73.64 | 91.48 |
| පෙබරවාර | 83.52 | 76.97 | - | 81.48 | 76.53 | 81.33 |
| මාර්තු | 78.93 | 73.05 | 84.05 | 84.57 | 80.23 | 82.76 |
| අප්‍රේල් | 83.09 | 79.10 | 90.49 | 88.99 | 84.47 | 86.00 |
| මැයි | 76.05 | 72.05 | 86.90 | 83.28 | 78.97 | 88.49 |
| ජූනි | 74.85 | 70.13 | 90.90 | 82.58 | 78.42 | 92.88 |
| ජූලි | 79.90 | 75.52 | 81.29 | 84.14 | 80.85 | 87.57 |
| අගෝස්තු | 85.09 | 81.28 | 81.53 | 79.03 | 75.71 | - |
| සැප්තැම්බර් | 91.89 | 88.72 | - | 73.27 | 69.93 | 87.38 |
| ඔක්තෝබර් | 89.19 | 86.16 | 88.98 | 75.29 | 71.55 | 81.75 |
| නොවැම්බර් | 82.22 | 77.58 | 99.98 | 73.51 | 69.73 | |
| දෙසැම්බර් | 77.53 | 72.36 | 97.62 | | | |

| දිනය | 2023 බ්‍රෙන්ට් | 2023 ඩබ්ලිව්.ටී.අයි. | 2024 බ්‍රෙන්ට් | 2024 ඩබ්ලිව්.ටී.අයි. |
|---|---|---|---|---|
| 21-12 | 79.14 | 73.72 | - | - |
| 22-12 | 79.83 | 74.31 | - | - |
| 23-12 | - | - | 73.26 | 69.80 |
| 24-12 | - | - | 72.86 | 69.44 |
| 25-12 | - | - | - | - |
| 26-12 | - | - | 73.77 | 70.29 |
| 27-12 | 80.78 | 75.22 | 73.21 | 69.56 |





මූලයන්: බ්ලූම්බර්ග් තොරතුරු සේවය
ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව

## 1.10 දෛනික විදුලිබල උත්පාදනය

| | 2024-12-23 | 2024-12-24 | 2024-12-25 | 2024-12-26 |
|---|---|---|---|---|
| උපරිම ඉල්ලුම (මෙ. වො.) | 2,541.60 | 2,505.00 | 2,158.00 | 2,453.40 |
| මුළු උත්පාදනය (ගි. වො. පැ) | 45.65 | 44.92 | 37.90 | 43.08 |
| ජල | 24.71 | 21.33 | 19.53 | 21.28 |
| ගල් අඟුරු | 12.98 | 13.02 | 11.49 | 12.79 |
| තෙල් | 3.96 | 6.75 | 2.95 | 4.90 |
| සුළං | 0.26 | 0.05 | 0.14 | 0.31 |
| සූර්ය (තොග) | 3.44 | 3.49 | 3.49 | 3.48 |
| ජෛව ස්කන්ධය | 0.30 | 0.29 | 0.29 | 0.32 |




මූලය: ලංකා විදුලිබල මණ්ඩලය


(අ) කුටුම්භ ජනගහනය අවුරුදු 15 සහ ඊට වැඩි
(ආ) ජාත්‍යන්තර ප්‍රමිති වර්ගීකරණ 4 වන සංශෝධනය මත පදනම් වේ.
(ඇ) ලං.ඛ.නී.සං. ආනයන මිල ගණන්වලට ගැල් කුලී ඇතුළත් වීම සහ එය විවිධ බොරතෙල් වර්ගවල සාමාන්‍ය මිල ගණන් අනුව බර තබන ලද මිලක් වන බැවින් ලං.ඛ.නී.සං. ආනයන මිල, බ්‍රෙන්ට් සහ ඩබ්ලිව්.ටී.අයි. ඉදිරි වෙළඳපොළ මිල ගණන් සමඟ ඍජුව සැසඳිය නොහැකිය. එසේම, ලං.ඛ.නී.සං. ආනයනවලින් කොටසක් කාලීන ගිවිසුම් මත පදනම් වේ. 2023 වසරේ පෙබරවාරි, සැප්තැම්බර් සහ 2024 අගෝස්තු යන මාසවල දී බොරතෙල් ආනයනය කර නැත.
(ඈ) තාවකාලික

# මුදල් අංශය

## 2.1 පොලී අනුපාතික (වාර්ෂික අනුපාතය ප්‍රතිශතයක් ලෙස)

| ප්‍රතිපත්ති පොලී අනුපාතිකය | වසරකට පෙර | සතියකට පෙර | මෙම සතිය |
|---|---|---|---|
| එක්දින ප්‍රතිපත්ති පොලී අනුපාතිකය (OPR) (අ) | - | 8.00 | 8.00 |
| **නිත්‍ය පහසුකම් අනුපාතික (අ)** | | | |
| නිත්‍ය තැන්පතු පහසුකම් අනුපාතිකය | 9.00 | 7.50 | 7.50 |
| නිත්‍ය ණය පහසුකම් අනුපාතිකය | 10.00 | 8.50 | 8.50 |
| **ඒක්ෂණ මුදල් වෙළඳපොළ** | | | |
| බරිත සාමාන්‍ය ඒක්ෂණ මුදල් අනුපාතිකය (AWCMR) (සතිපතා සාමාන්‍යය) | 9.12 | 8.00 | 7.99 |
| **භාණ්ඩාගාර බිල්පත් ඵලදා අනුපාතික (ප්‍රාථමික වෙළඳපොළ)** | | | |
| දින 91 | 14.51 | 8.66 | 8.62 |
| දින 182 | 14.16 | 8.81 | 8.77 |
| දින 364 | 12.93 | 9.02 | 8.96 |
| **බලපත්‍රලාභී වාණිජ බැංකු** | | | |
| බරිත සාමාන්‍යය ප්‍රමුඛ ණය පොලී අනුපාතිකය (AWPR) | 12.13 | 8.72 | 9.06 |

එක්දින ප්‍රතිපත්ති පොලී අනුපාතිකය සහ බරිත සාමාන්‍ය ඒක්ෂණ මුදල් අනුපාතිකය




| | 2023 ඔක්තෝබර් | 2024 සැප්තැම්බර් | 2024 ඔක්තෝබර් |
|---|---|---|---|
| ඉතිරිකිරීමේ තැන්පතු | 0.25 - 13.00 | 0.25 - 9.00 | 0.25 - 9.00 |
| එක් අවුරුදු ස්ථාවර තැන්පතු | 1.00 - 24.80 | 2.50 - 18.39 | 2.50 - 18.39 |

| | 2023 නොවැම්බර් | 2024 ඔක්තෝබර් | 2024 නොවැම්බර් |
|---|---|---|---|
| බරිත සාමාන්‍ය තැන්පතු අනුපාතිකය (AWDR) | 12.11 | 7.61 | 7.59 |
| බරිත සාමාන්‍ය ස්ථාවර තැන්පතු අනුපාතිකය (AWFDR) | 15.54 | 9.46 | 9.36 |

| | 2023 ඔක්තෝබර් | 2024 සැප්තැම්බර් | 2024 ඔක්තෝබර් |
|---|---|---|---|
| බරිත සාමාන්‍ය නව තැන්පතු අනුපාතිකය (AWNDR) | 11.51 | 7.18 | 7.18 |
| බරිත සාමාන්‍ය නව ස්ථාවර තැන්පතු අනුපාතිකය (AWNFDR) | 11.78 | 7.27 | 7.23 |
| බරිත සාමාන්‍ය ණය පොලී අනුපාතිකය (AWLR) | 15.18 | 12.14 | 12.09 |
| බරිත සාමාන්‍ය නව ණය පොලී අනුපාතිකය (AWNLR) | 15.98 | 11.33 | 11.15 |

| ජාතික ඉතිරිකිරීමේ බැංකුව | 2023 ඔක්තෝබර් | 2024 සැප්තැම්බර් | 2024 ඔක්තෝබර් |
|---|---|---|---|
| ඉතිරිකිරීමේ තැන්පතු | 3.00 | 3.00 | 3.00 |
| එක් අවුරුදු ස්ථාවර තැන්පතු | 8.50 | 7.75 | 7.75 |

| භාණ්ඩාර බැඳුම්කර වෙන්දේසිය | වසර 04 මාස 09 2024 දෙසැම්බර් 12 | වසර 08 මාස 06 2024 දෙසැම්බර් 12 |
|---|---|---|
| පොලී අනුපාතිකය | 11.00 | 9.00 |
| බර තබන ලද සාමාන්‍ය ඵලදා අනුපාතිකය | 10.75 | 11.47 |

### බරිත සාමාන්‍ය ප්‍රමුඛ ණය අනුපාතිකය බැංකු අනුව


| | සතියකට පෙර | මෙම සතිය | | සතියකට පෙර | මෙම සතිය |
|---|---|---|---|---|---|
| ලංකා බැංකුව | 9.29 | 9.25 | කාර්ගිල්ස් බැංකුව (ආ) | 9.64 | 9.64 |
| මහජන බැංකුව | 8.43 | 9.65 | එච්එස්බීසී බැංකුව | 8.24 | 8.72 |
| හැටන් නැෂනල් බැංකුව | 8.59 | 8.89 | ස්ටෑන්ඩර්ඩ් චාර්ටඩ් බැංකුව | 8.62 | 8.82 |
| කොමර්ෂල් බැංකුව | 9.25 | 8.66 | සිටි බැංකුව (ආ) | 8.25 | 8.25 |
| සම්පත් බැංකුව | 8.75 | 8.61 | ඩොයිෂ් බැංකුව | 8.38 | 8.31 |
| සෙලාන් බැංකුව | 10.84 | 10.08 | හබීබ් බැංකුව | 9.61 | 9.90 |
| යූනියන් බැංකුව | 8.54 | 9.18 | ඉන්දියන් බැංකුව | 10.11 | 10.11 |
| පැන් ඒෂියා බැංකුව | 8.68 | 8.21 | ඉන්දියන් ඕවර්සීස් බැංකුව (ආ) | 9.60 | 9.60 |
| නේෂන්ස් ට්‍රස්ට් බැංකුව | 8.82 | 8.71 | එම්සීබී බැංකුව (ආ) | 9.40 | 9.40 |
| ඩීඑෆ්සීසී බැංකුව | 9.02 | 9.47 | ඉන්දීය රාජ්‍ය බැංකුව | 10.11 | 10.11 |
| එන්ඩීබී බැංකුව | 9.35 | 9.44 | පබ්ලික් බැංකුව | 11.75 | 11.75 |
| අමානා බැංකුව | 8.26 | 8.75 | බෑන්ක් ඔෆ් චයිනා | - | - |


(අ) 2024 නොවැම්බර් 27 වැනි දින සිට බලපැවැත්වෙන පරිදි, එක්දින ප්‍රතිපත්ති පොලී අනුපාතිකය ශ්‍රී ලංකා මහ බැංකුවේ ප්‍රතිපත්ති පොලී අනුපාතිකය ලෙස අර්ථ දැක්වේ. පදනම් අංක ± 50 ආන්තික සමඟ, නිත්‍ය තැන්පතු පහසුකම් අනුපාතිකය සහ නිත්‍ය ණය පහසුකම් අනුපාතිකය එක්දින ප්‍රතිපත්ති පොලී අනුපාතිකයට සම්බන්ධ කෙරේ.


(ආ) බැංකුව විසින් මෙම සතිය තුළ දී ප්‍රමුඛ ගණුදෙනුකරුවන් හට කිසිදු ණය පහසුකමක් ලබා දී නොමැත. එබැවින් ආසන්නතම සතියට අදාළ ණය අනුපාතිකය සඳහන් කර ඇත.

## 2.2 මුදල් සැපයුම

| | රු. බිලියන | | | වාර්ෂික වෙනස (%) | | |
|---|---|---|---|---|---|---|
| | ඔක්. 2023[අ] | සැප්. 2024 | ඔක්. 2024[ආ] | ඔක්. 2023[අ] | සැප්. 2024 | ඔක්. 2024[ආ] |
| සංචිත මුදල් | 1,396.5 | 1,523.6 | 1,474.6 | 4.1 | 22.5 | 5.6 |
| පටු මුදල් සැපයුම (M1) | 1,497.7 | 1,809.4 | 1,801.7 | 2.8 | 19.0 | 20.3 |
| පුළුල් මුදල් සැපයුම (M2) | 11,175.2 | 12,306.3 | 12,364.9 | 8.1 | 10.6 | 10.6 |
| ඒකාබද්ධ පුළුල් මුදල් සැපයුම (M2b) | 12,859.4 | 13,949.9 | 14,008.6 | 6.8 | 8.9 | 8.9 |
| බැංකු පද්ධතිය සතු ශුද්ධ විදේශීය වත්කම්[ඇ] | (523.1) | 356.8 | 407.3 | 72.1 | 163.7 | 177.9 |
| මුදල් අධිකාරීන් | (919.1) | (52.4) | 18.6 | 43.8 | 94.7 | 102.0 |
| වාණිජ බැංකු | 396.0 | 409.2 | 388.7 | 266.4 | (4.0) | (1.8) |
| දේශීය බැංකු ඒකක (DBUs) | (270.3) | (258.3) | (242.7) | 48.2 | 4.1 | 10.2 |
| අක්වෙරළ බැංකු ඒකක (OBUs) | 666.3 | 667.4 | 631.4 | 134.9 | (4.0) | (5.2) |
| බැංකු පද්ධතිය සතු ශුද්ධ දේශීය වත්කම්[ඇ] | 13,382.5 | 13,593.1 | 13,601.4 | (3.9) | 1.7 | 1.6 |
| රජයේ ණය ගැනීම් (ශුද්ධ) | 7,692.4 | 8,016.4 | 7,953.5 | 7.2 | 2.9 | 3.4 |
| මහ බැංකුව | 2,353.6 | 1,745.7 | 1,674.2 | (29.8) | (28.0) | (28.9) |
| වාණිජ බැංකු | 5,338.8 | 6,270.6 | 6,279.3 | 39.5 | 16.9 | 17.6 |
| දේශීය බැංකු ඒකක (DBUs) | 5,093.5 | 6,109.0 | 6,120.5 | 50.7 | 19.4 | 20.2 |
| අක්වෙරළ බැංකු ඒකක (OBUs) | 245.3 | 161.7 | 158.8 | (45.1) | (33.6) | (35.3) |
| රාජ්‍ය සංස්ථාවලට දෙන ලද ණය | 1,115.3 | 657.4 | 666.2 | (37.3) | (40.5) | (40.3) |
| දේශීය බැංකු ඒකක (DBUs) | 1,057.6 | 607.0 | 616.0 | (38.1) | (42.0) | (41.8) |
| අක්වෙරළ බැංකු ඒකක (OBUs) | 57.7 | 50.3 | 50.1 | (17.7) | (12.6) | (13.1) |
| පෞද්ගලික අංශයට දෙන ලද ණය | 7,200.5 | 7,796.6 | 7,870.9 | (4.4) | 8.9 | 9.3 |
| දේශීය බැංකු ඒකක (DBUs) | 6,676.3 | 7,229.8 | 7,301.2 | (2.3) | 8.6 | 9.4 |
| අක්වෙරළ බැංකු ඒකක (OBUs) | 524.2 | 566.8 | 569.7 | (24.9) | 12.4 | 8.7 |
| අනෙකුත් අයිතම (ශුද්ධ) | (2,625.8) | (2,877.2) | (2,889.3) | (2.3) | (7.0) | (10.0) |












## 2.3 සංචිත මුදල් හා සංසරණයේ පවතින ව්‍යවහාර මුදල්

| | 2024-12-19 | 2024-12-26 |
|---|---|---|
| සංචිත මුදල් (රුපියල් මිලියන) | 1,554,475.88 | 1,563,743.91 |

| | 2024-12-20 | 2024-12-27 |
|---|---|---|
| සංසරණයේ පවතින ව්‍යවහාර මුදල් (රුපියල් මිලියන) | 1,349,134 | 1,358,812 |




## 2.4 මුදල් වෙළඳපොළ ක්‍රියාකාරකම් (දෛනික)

| **ඒක්ෂණ මුදල් වෙළඳපොළ** | 2024-12-23 | 2024-12-24 | 2024-12-26 | 2024-12-27 |
|---|---|---|---|---|
| බරිත සාමාන්‍ය අනුපාතිකය (වාර්ෂික පොලී අනුපාතිකය සියයට) | 8.00 | 8.00 | 8.00 | 7.99 |
| දළ වටිනාකම (රුපියල් බිලියන) | 18.40 | 23.70 | 20.08 | 4.76 |

| **වෙළඳපොළ ප්‍රතිමිලදී ගැනුම්** | 2024-12-23 | 2024-12-24 | 2024-12-26 | 2024-12-27 |
|---|---|---|---|---|
| බරිත සාමාන්‍ය අනුපාතිකය (වාර්ෂික පොලී අනුපාතිකය සියයට) | 8.09 | 8.13 | 8.12 | 8.06 |
| දළ වටිනාකම (රුපියල් බිලියන) | 30.88 | 24.06 | 33.80 | 48.10 |

## 2.5 ශ්‍රී ලංකා මහ බැංකුව සතු සුරැකුම්පත් ගොනුව

| | 2024-12-23 | 2024-12-24 | 2024-12-26 | 2024-12-27 |
|---|---|---|---|---|
| ශ්‍රී ලංකා මහ බැංකුව සතු භාණ්ඩාගාර බිල්පත්/බැඳුම්කර ප්‍රමාණය - මුහුණත අගය (රුපියල් බිලියන) | 2,516 | 2,516 | 2,516 | 2,516 |
| ශ්‍රී ලංකා මහ බැංකුව සතු භාණ්ඩාගාර බිල්පත්/බැඳුම්කර ප්‍රමාණය - පොත් අගය (රුපියල් බිලියන) | 1,486 | 1,494 | 1,494 | 1,526 |

(අ) සංශෝධිත
(ආ) තාවකාලික
(ඇ) ඒකාබද්ධ පුළුල් මුදල් සැපයුම (M2b) අදාළව

## 2.6 විවෘත වෙළඳ කටයුතු

| අයිතමය | 2024 දෙසැ. 23 | 2024 දෙසැ. 24 | 2024 දෙසැ. 26 | 2024 දෙසැ. 27 |
|---|---|---|---|---|
| **කෙටි කාලීන වෙන්දේසි** | | | | |
| පිරිනමන ලද ප්‍රතිමිලදී ගැනුම් ප්‍රමාණය (රු. බිලියන) | | 25.00 | | |
| පිරිනමන ලද ප්‍රතිවිකුණුම් ප්‍රමාණය (රු. බිලියන) | | 7.00 | | |
| කාල සීමාව (දින ගණන) | | 43 | | |
| ලැබුණු ලංසු ප්‍රමාණය (රු. බිලියන) | | 25.00 | | |
| පිළිගත් ප්‍රමාණය (රු. බිලියන) | | 8.06 | | |
| අවම පිළිගත් අනුපාතිකය (වා.පො.අ. සියයට) | | 8.15 | | |
| උපරිම පිළිගත් අනුපාතිකය (වා.පො.අ. සියයට) | | 8.11 | | |
| බරිත සාමාන්‍ය ඵලදා අනුපාතිකය (වා.පො.අ. සියයට) | | | | |
| **ස්ථිර පදනම මත වෙන්දේසි** | | | | |
| ස්ථිර පදනම මත භාණ්ඩාගාර බිල්පත් විකිණීම (රු. බිලියන) | | | | |
| ස්ථිර පදනම මත භාණ්ඩාගාර බිල්පත් මිලදී ගැනුම් (රු. බිලියන) | | | | |
| පියවීමේ දිනය | | | | |
| පරිණත වන දිනය | | | | |
| කාල සීමාව (දින ගණන) | | | | |
| ලැබුණු ලංසු ප්‍රමාණය (රු. බිලියන) | | | | |
| පිළිගත් ප්‍රමාණය (රු. බිලියන) | | | | |
| අවම පිළිගත් අනුපාතිකය (වා.පො.අ. සියයට) | | | | |
| උපරිම පිළිගත් අනුපාතිකය (වා.පො.අ. සියයට) | | | | |
| බරිත සාමාන්‍ය ඵලදා අනුපාතිකය (වා.පො.අ. සියයට) | | | | |
| **දිගු කාලීන වෙන්දේසි** | | | | |
| පිළිගත් ප්‍රතිමිලදී ගැනුම් ප්‍රමාණය (රු. බිලියන) | | | | |
| පිළිගත් ප්‍රතිවිකුණුම් ප්‍රමාණය (රු. බිලියන) | | | | |
| පියවීමේ දිනය | | | | |
| පරිණත වන දිනය | | | | |
| කාල සීමාව (දින ගණන) | | | | |
| ලැබුණු ලංසු ප්‍රමාණය (රු. බිලියන) | | | | |
| පිළිගත් ප්‍රමාණය (රු. බිලියන) | | | | |
| අවම පිළිගත් අනුපාතිකය (වා.පො.අ. සියයට) | | | | |
| උපරිම පිළිගත් අනුපාතිකය (වා.පො.අ. සියයට) | | | | |
| බරිත සාමාන්‍ය ඵලදා අනුපාතිකය (වා.පො.අ. සියයට) | | | | |
| **ද්‍රවශීලතා පහසුකම් වෙන්දේසි** | | | | |
| පිරිනමන ලද ප්‍රතිවිකුණුම් ප්‍රමාණය (රු. බිලියන) | | | | |
| පියවීමේ දිනය | | | | |
| පරිණත වන දිනය | | | | |
| කාල සීමාව (දින ගණන) | | | | |
| ලැබුණු ලංසු ප්‍රමාණය (රු. බිලියන) | | | | |
| පිළිගත් ප්‍රතිවිකුණුම් ප්‍රමාණය (රු. බිලියන) | | | | |
| අවම පිළිගත් අනුපාතිකය (වා.පො.අ. සියයට) | | | | |
| උපරිම පිළිගත් අනුපාතිකය (වා.පො.අ. සියයට) | | | | |
| බරිත සාමාන්‍ය ඵලදා අනුපාතිකය (වා.පො.අ. සියයට) | | | | |
| **නිත්‍ය පහසුකම** | | | | |
| නිත්‍ය තැන්පතු පහසුකම (රු. බිලියන) | 198.797 | 184.866 | 162.800 | 173.671 |
| නිත්‍ය ණය පහසුකම (රු. බිලියන) | 1.291 | 0.500 | 2.500 | 0.399 |
| | | | | |
| **සමස්ත වෙළඳපොළ එක් දින ද්‍රවශීලතාව (රු. බිලියන)** | **197.506** | **159.366** | **160.300** | **173.272** |
| **සමස්ත වෙළඳපොළ ද්‍රවශීලතාව (රු. බිලියන)[අ]** | **162.506** | **159.366** | **135.300** | **148.272** |

(අ) සමස්ත වෙළඳපොළ ද්‍රවශීලතාවෙන් නිරූපණය වන්නේ කෙටි කාලීන සහ දිගු කාලීන නොපියවූ ප්‍රතිමිලදීගැනුම්/ප්‍රතිවිකුණුම් ගණුදෙනු ගළපන ලද එක් දින ද්‍රවශීලතාවයි.

## 2.7 ණය කාඩ්පත් සහ වාණිජ පත්‍රිකා නිකුතු

### 2.7.1 ණය කාඩ්පත්[(අ)]


| | 2023 දෙසැම්බර් | 2024 සැප්තැම්බර් | 2024 ඔක්තෝබර් [(ආ)] |
|---|---|---|---|
| මුළු සක්‍රිය කාඩ්පත් ගණන | 1,917,085 | 1,936,336 | 1,942,989 |
| දේශීය (දේශීය වශයෙන් පිළිගත් ඒවා පමණි) | 10,768 | 10,029 | 9,930 |
| ගෝලීය (ගෝලීය වශයෙන් පිළිගත්) | 1,906,317 | 1,926,307 | 1,933,059 |
| නොපියවූ ශේෂය (රු. මිලියන) | 151,373 | 151,105 | 151,293 |
| දේශීය (දේශීය වශයෙන් පිළිගත් ඒවා පමණි) | 35,838 | 34,145 | 34,221 |
| ගෝලීය (ගෝලීය වශයෙන් පිළිගත්) | 115,534 | 116,960 | 117,072 |

### 2.7.2 වාණිජ පත්‍රිකා නිකුතු[(ඇ)]


| | 2023 දෙසැම්බර් | 2024 සැප්තැම්බර් | 2024 ඔක්තෝබර් [(ආ)] |
|---|---|---|---|
| සමස්ත නිකුතුව (සමුච්චිත) - රු. බිලියන [(ඈ)] | 1.3 | 2.3 | 2.3 |
| ගෝලීය (ගෝලීය වශයෙන් පිළිගත්) - රු. බිලියන | 0.7 | 0.9 | 0.9 |

(අ) බලපත්‍රලාභී වාණිජ බැංකු විසින් නිකුත් කරන ලද (ආ) තාවකාලික
(ඇ) බලපත්‍රලාභී වාණිජ බැංකු සහ බලපත්‍රලාභී විශේෂිත බැංකු සපයන ලද දත්ත මත පදනම්ව
(ඈ) වසරේ මේ දක්වා එකතුව

**වාණිජ පත්‍රිකා නිකුතු (සමුච්චිත)**





**ණය කාඩ්පත් - නොපියවූ ශේෂය**




## 2.8 කොටස් වෙළඳපොළ

| | 2023-12-29 | 2024-12-20 | 2024-12-27 |
|---|---|---|---|
| සමස්ත කොටස් මිල දර්ශකය (1985 = 100) (ASPI) | 10,654.16 | 14,810.70 | 15,535.60 |
| එස් ඇන්ඩ් පී ශ්‍රී ලංකා 20 දර්ශකය (2004 = 1,000) (S&P SL20) | 3,068.36 | 4,420.79 | 4,666.65 |
| දෛනික පිරිවැටුම (රු. මිලියන) | 642.44 | 9,230.62 | 9,819.04 |
| වෙළඳපොළ ප්‍රාග්ධනීකරණය (රු. බිලියන) | 4,248.93 | 5,358.06 | 5,607.50 |
| විදේශීය මිලදී ගැනීම් (රු. මිලියන) | 62.29 | 127.33 | 207.44 |
| විදේශීය විකිණුම් (රු. මිලියන) | 41.22 | 354.20 | 202.71 |
| ශුද්ධ විදේශ මිලදී ගැනීම් (රු. මිලියන) | 21.06 | (226.87) | 4.73 |

**කොටස් වෙළඳපොළ - මාසය අවසානයට**




# රාජ්‍ය මූල්‍ය අංශය

## 3.1 රාජ්‍ය මූල්‍ය කටයුතු (රු. බිලියන)

| ශීර්ෂය | 2023 ජන. - ඔක්. | 2024 ජන. - ඔක්. (අ) |
|---|---|---|
| ආදායම් සහ ප්‍රදාන | 2,434.03 | 3,266.94 |
| ආදායම | 2,424.83 | 3,255.71 |
| බදු ආදායම | 2,212.51 | 3,000.25 |
| බදු නොවන ආදායම | 212.32 | 255.47 |
| ප්‍රදාන | 9.20 | 11.23 |
| වියදම් සහ ආපසු ගෙවීම් අඩු කළ පසු ශුද්ධ ණයදීම් | 3,981.05 | 4,327.69 |
| පුනරාවර්තන | 3,532.25 | 3,796.05 |
| ප්‍රාග්ධන වියදම් සහ ආපසු ගෙවීම් අඩු කළ පසු ශුද්ධ ණයදීම් | 448.80 | 531.65 |
| ප්‍රාථමික ශේෂය | 225.37 | 830.70 |
| සමස්ත අයවැය ශේෂය | (1,547.02) | (1,060.75) |


